මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා නාවික හමුදාව ශ්‍රී ලංකාවට දකුණු දෙසින් වූ ජාත්‍යන්තර මුහුදේදී මත්ද්‍රව්‍ය තොගයක් ප්‍රවාහනය කල බවට සැකකෙරෙන යාත්‍රාවක් අත්අඩංගුවට ගනියි

ශ්‍රී ලංකා නාවික හමුදාව, දෙවුන්දරට දකුණු දෙසින් වූ ජාත්‍යන්තර මුහුදේ සිදු කරන ලද විශේෂ සෝදිසි මෙහෙයුමකදී, හෙරොයින් සහ අයිස් බවට සැක කෙරෙන මත්ද්‍රව්‍ය තොගයක් ප්‍රවාහනය කරමින් තිබූ යාත්‍රාවක් සමඟ ජාවාරම්කරුවන් හත් දෙනෙකු (07) අත්අඩංගුවට ගනු ලැබීය.

නාවික හමුදාව දේශීය හා විදේශීය බුද්ධි අංශ සහ සමුද්‍රීය හවුල්කරුවන් සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයෙන් ඔබ්බට මත්ද්‍රව්‍ය වැටලීමේ මෙහෙයුම් දියත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, මෙම මෙහෙයුම සාර්ථකව සිදු කරන ලදී.

ඒ අනුව, නාවික හමුදා භාරයට ගත් සැකකරුවන් සමඟ ධජ රහිත යාත්‍රාව, මේ වන විට ඉදිරි විමර්ශන සහ නීතිමය කටයුතු සඳහා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත භාර දීමට ගොඩබිමට රැගෙන එමින් සිටියි.

ඉන්දියානු සාගරයේ ඇති නෞකා ගමන් මාර්ග ඔස්සේ නිදහස් මුහුදු ගමනාගමනය තහවුරු කිරීම වෙනුවෙන්, ශ්‍රී ලංකා නාවික හමුදාව කලාපීය සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සිදුකල ශක්තිමත් සම්බන්ධීකරණයක ප්‍රතිඵලයක් ලෙස මෙම මෙහෙයුම සාර්ථකව සිදුකිරීමට හැකි විය.

එමෙන්ම, ශ්‍රී ලංකා නාවික හමුදාව ලොව විශාලතම බහු ජාතික නාවික සන්ධානය වන, ඒකාබද්ධ සමුද්‍රීය බලකායේ සාමාජිකත්වය ලබා තිබීම සහ කොළඹ තොරතුරු විලයන මධ්‍යස්ථානය හරහා තත්‍යකාලීන නිවැරදි තොරතුරු සහිතව සමුද්‍රීය වසම් පිළිබඳ සියලු සමුද්‍රීය පාර්ශ්වයන්ගේ දැනුවත්භාවය ශක්තිමත් කර ඇත.

කොළඹ තොරතුරු විලයන මධ්‍යස්ථානය හරහා බුද්ධි තොරතුරු සහ සමුද්‍රීය තර්ජන තක්සේරු කිරීම් සඳහා වන්ද්‍රිකා තාක්ෂණය ඇතුළු නවීන තාක්ෂණය ඔස්සේ ලබාගන්නා දත්ත ඒකාබද්ධ කෙරෙන අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ සිදුකෙරෙන ඒකාබද්ධ ගුවන් ආවේක්ෂණ සහ නිරක්ෂණ මගින්, සාගරයේ නිරීක්ෂණ වපසරිය පුළුල් කර ඇත.

මත්ද්‍රව්‍ය උවදුර පිටුදැකීම වෙනුවෙන් පසුගිය 2025 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී රජය විසින් ආරම්භ කරන ලද "රටම එකට" ජාතික මෙහෙයුමේ දිගුවක් ලෙස ජාත්‍යන්තර මුහුදේදී මෙම මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමේ සාර්ථක මෙහෙයුම සිදුකරනු ලැබීය.

ඒ අනුව, "රටම එකට" ජාතික මෙහෙයුම ආරම්භ වූ දා සිට මේ දක්වා සිදුකල මෙහෙයුම් මගින්, නාවික හමුදාව රුපියල් බිලියන 116 කට (රුපියල් කෝටි 11,600) අධික දල වටිනාකමකින් යුත් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත. මෙම මෙහෙයුමත් සමඟ 2026 වර්ෂයේ ජනවාරි මාසයේ සිට මේ දක්වා සිදුකල මෙහෙයුම් මගින්, විදේශීය යාත්‍රා 04 ක් ඇතුළුව යාත්‍රා 66 ක් සහ විදේශීය පුද්ගලයන් 18ක් ඇතුළුව සැකකරුවන් 379 ක් නීතිය හමුවට පමුණුවා ඇත.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ඉදිරියේදී ලබා දීමට නාවික හමුදාව බලාපොරොත්තු වේ.

Media Release

Navy seizes suspected drug vessel in international waters off south coast

The Sri Lanka Navy apprehended seven (07) suspects and seized a boat (01) suspected of carrying heroin and crystal methamphetamine (ice), during a search operation in international waters south of Dondra.

This operation was successfully executed as a result of the Sri Lanka Navy, working with local and foreign intelligence agencies and maritime partners, conducting anti-narcotic operations extending beyond Sri Lanka's Exclusive Economic Zone (EEZ).

The Navy is currently escorting the stateless vessel and the detained suspects ashore to hand them over to the Police Narcotic Bureau (PNB) for further investigation and legal proceedings.

The operation's success was made possible by the strong coordination between the Sri Lanka Navy and regional and international partners to ensure freedom of navigation along Indian Ocean shipping routes.

Furthermore, as a member of the Combined Maritime Forces (CMF), the world's largest multinational naval coalition, and through the Information Fusion Centre (IFC) Colombo, the Sri Lanka Navy has strengthened maritime domain awareness among all stakeholders with real-time and accurate information.

IFC Colombo integrates data from modern technologies, including satellites, for intelligence and maritime threat assessments, while joint aerial surveillance with the Sri Lanka Air Force has widened the Navy's ocean surveillance coverage.

The seizure is a result of the government's 'A Nation United' anti-narcotic operation launched in October 2025. Since that campaign began, naval operations have seized narcotics with an estimated gross street value of more than Rs 116 billion. Through operations conducted from January 2026 to date, 66 boats, including 04 foreign boats, and 379 suspects, including 18 foreign nationals, have been handed over for legal proceedings, for their involvement in narcotic smuggling.

More details regarding the incident will be released in due course.

<u>ஊடக அறிவித்தல்</u>

இலங்கையின் தெற்கே சர்வதேச கடற்பரப்பில் போதைப்பொருட்களை கடத்திச் சென்றதாக சந்தேகிக்கப்படும் படகொன்றை இலங்கை கடற்படை கைப்பற்றியது.

இலங்கை கடற்படையினரால், தேவேந்திரமுனைக்கு தெற்கே அமைந்துள்ள சர்வதேச கடற்பரப்பில் மேற்கொள்ளப்பட்ட விசேட தேடுதல் நடவடிக்கையின்போது, ஹெரோயின் மற்றும் ஐஸ் என சந்தேகிக்கப்படும் போதைப்பொருட்களை ஏற்றிச் சென்ற படகொன்றுடன் ஏழு (07) போதைப்பொருள் கடத்தல்காரர்கள் கைது செய்யப்பட்டுள்ளனர்.

இலங்கையின் விசேட பொருளாதார வலயத்திற்கு அப்பாற்பட்ட கடற்பரப்பில் போதைப்பொருள் கடத்தலை முறியடிக்கும் வகையில், உள்நாட்டு மற்றும் வெளிநாட்டு புலனாய்வுப் பிரிவுகள் மற்றும் கடல்சார் தரப்பினருடன் இணைந்து இலங்கை கடற்படையினரால் முன்னெடுக்கப்பட்டு வரும் நடவடிக்கைகளின் விளைவாக இந்த நடவடிக்கை வெற்றிகரமாக மேற்கொள்ளப்பட்டது.

அதற்கமைய, கடற்படையினரால் கைப்பற்றப்பட்ட கொடியற்ற படகும், கைது செய்யப்பட்ட சந்தேகநபர்களும் மேலதிக விசாரணைகள் மற்றும் சட்ட நடவடிக்கைகளுக்காக பொலிஸ் போதைப்பொருள் ஒழிப்பு பணியகத்திடம் ஒப்படைக்கும் பொருட்டு தற்போது கரைக்கு அழைத்து வரப்படுகின்றனர்.

இந்தியப் பெருங்கடலில் அமைந்துள்ள கப்பல் போக்குவரத்துப் பாதைகளில் சுதந்திரமான கடல்சார் போக்குவரத்தை உறுதிப்படுத்தும் நோக்கில், இலங்கை கடற்படையானது பிராந்திய மற்றும் சர்வதேச தரப்பினருடன் மேற்கொண்ட வலுவான ஒருங்கிணைப்பின் விளைவாக இந்நடவடிக்கையை வெற்றிகரமாக முன்னெடுக்க முடிந்தது.

அத்துடன், உலகின் மிகப்பெரிய பல்தேசிய கடல்சார் படைக் கூட்டமைப்பான ஒருங்கிணைந்த கடல்சார் படைகளின் உறுப்பினராக இலங்கை கடற்படை அங்கம் வகிப்பதுடன், கொழும்பு தகவல் ஒருங்கிணைப்பு நிலையத்தின் ஊடாக பெறப்படும் துல்லியமான தகவல்களைப் பகிர்ந்துகொள்வதன் மூலம், கடல்சார் கள நிலைமை தொடர்பில் அனைத்து கடல்சார் தரப்பினரினதும் விழிப்புணர்வை மேம்படுத்துவதற்கும் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது.

கொழும்பு தகவல் ஒருங்கிணைப்பு நிலையத்தின் ஊடாக, புலனாய்வுத் தகவல்கள் மற்றும் கடல்சார் அச்சுறுத்தல் மதிப்பீடுகளுக்காக செயற்கைக்கோள் தொழில்நுட்பம் உள்ளிட்ட நவீன தொழில்நுட்பங்களின் மூலம் பெறப்படும் தரவுகள் ஒருங்கிணைக்கப்படுகின்றன. மேலும், இலங்கை விமானப்படையுடன் இணைந்து முன்னெடுக்கப்படும் கூட்டு வான்வழி கண்காணிப்பு மற்றும் ரோந்து நடவடிக்கைகள் மூலம் கடற்பரப்பைக் கண்காணிக்கும் வீச்செல்லை விரிவுபடுத்தப்பட்டுள்ளது.

போதைப்பொருள் அச்சுறுத்தலை ஒழிக்கும் நோக்கில், அரசாங்கத்தினால் கடந்த 2025 ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் ஆரம்பிக்கப்பட்ட "முழு நாடுமே ஒன்றாக" தேசிய நடவடிக்கையின் தொடர்ச்சியாக, சர்வதேச கடற்பரப்பில் போதைப்பொருட்களைக் கைப்பற்றும் இந்த வெற்றிகரமான நடவடிக்கை முன்னெடுக்கப்பட்டது.

அதற்கமைய, "முழு நாடுமே ஒன்றாக" தேசிய நடவடிக்கை ஆரம்பிக்கப்பட்டது முதல் இதுவரை முன்னெடுக்கப்பட்ட நடவடிக்கைகளின் மூலம், 116 பில்லியன் ரூபாவிற்கும் அதிகமான மொத்த வீதிப் பெறுமதியைக் கொண்ட போதைப்பொருட்களை இலங்கை கடற்படை கைப்பற்றியுள்ளது. மேலும், 2026 ஆம் ஆண்டு ஜனவரி மாதம் முதல் இதுவரை முன்னெடுக்கப்பட்ட நடவடிக்கைகளின் மூலம், 04 வெளிநாட்டுப் படகுகள் உட்பட மொத்தம் 66 படகுகளும், 18 வெளிநாட்டுப் பிரஜைகள் உட்பட 379 சந்தேகநபர்களும் கைது செய்யப்பட்டு சட்டத்தின் முன் நிறுத்தப்பட்டுள்ளனர்.

இது தொடர்பான மேலதிக தகவல்களை எதிர்காலத்தில் வெளியிடுவதற்கு இலங்கை கடற்படை எதிர்பார்க்கின்றது.